අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/68/12/දේ.නි.(14/2022 II)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.10.19

සියලුම අතිරේක ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන),
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යපන අධ්‍යක්ෂවරුන්,
පීඨාධිපතිවරුන්,
විදුහල්පතිවරුන් (ගුරු විද්‍යාල),
විදුහල්පතිවරුන් (ජාතික පාසල්),
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන් සඳහා දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු ලබාදීම.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා සහ ඒකාබද්ධ සේවා නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධරයන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) අනුව දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම සලකා බැලීම සඳහා අදාළ නිවාඩු ඉල්ලීම මේ සමඟ අමුණා ඇති ආකෘති අංක 01 පරිදි සේවාවට අදාළ අතිරේක ලේකම් හරහා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

02. එම නිවාඩුව සඳහා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් පසු අදාළ අයදුම්පත නැවත පෞද්ගලික ලිපිගොනුව දක්වා යොමු කළ යුතු අතර, නිලධරයාගේ දේශීය වැටුප් රහිත නිවාඩුව අනුමත කරන ලිපිය පෞද්ගලික ලිපිගොනුව භාර මාණ්ඩලික නිලධාරියාගේ අත්සනින් අදාළ නිලධරයාට නිකුත් කළ යුතුය. තවද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022.09.20 දිනැතිව නිකුත් කළ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 හි විධිවිධාන පරිදි අදාළ පාර්ශවයන් විසින් මෙම නිවාඩු අනුමත කිරීමේදී කටයුතු කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

03. තවද, මේ වන විටත් දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති නිලධරයන්ද අදාළ ආකෘතිය අනුව නැවත ඉල්ලුම් කළ යුතු බව වැඩිදුරටත් දන්වමි.

පී.එල්.පත්මකුමාර
අතිරේක ලේකම් (පාලන)

අත්/ කළේ : එම්.එන්. රණසිංහ
අධ්‍යාපන ලේකම්